Australian Government

Department of Home Affairs

# මගී යාත්‍රා නැව් කර්මාන්තය

ඕස්ට්‍රේලියාවේ මගී යාත්‍රා නැව් ක්‍රියාත්මක වීම සඳහා 2015 ජීව ආරක්ෂණ පනත යටතේ මිනිස් ජීවිත ආරක්ෂණ ආපදා කාල පරිච්ඡේදය මාස තුනකින් දීර්ඝ කළ බව 2021 සැප්තැම්බර් 02 වන දින [රජය නිවේදන කළේය.](#) මේවා අතර පහත දේ ඇත:

- මගී යාත්‍රා නැව් ඕස්ට්‍රේලියානු දේශභූමි සහ ඕස්ට්‍රේලියානු තොටුපළ වෙත ඇතුළු වීම සම්බන්ධයෙන් වර්තමාන සීමා **2021 දෙසැම්බර් 17**, තෙක් දීර්ඝ කිරීම; ස
- මෙම සීමා, මගීන් 100 ක් හෝ වැඩි ප්‍රමාණයක් ගෙන යා හැකි කaaස් නැ සම්බන්ධයෙන් දිගටම අදාළ වීම.

මෙම සීමා කෙළින්ම පැමිණෙන සහ ලොව වටා යන කaaස් චාරිකා Round Trip Cruises (RTC) සම්බන්ධයෙන් ද අදාළ වීම.

# විශාල මගී යාත්‍රා

විශාල මගී යාත්‍රාවල කාර්ය මණ්ඩලය (නාවික නැවතුම් අංග 99 ක් ඇතුළුව) ඕස්ට්‍රේලියාවේ සංචාරක සීමාවලින් නිදහස් නොවන අතර ඕස්ට්‍රේලියාවට ගමන් කිරීමට පෙර සංචාරක නිදහස් කිරීමේ ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය. [සංචාරක නිදහස් කිරීමේ ද්වාරය](#) හරහා මෙය කළ හැකිය.

යාත්‍රාව ආරක්ෂිතව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය පමණක් නිදහස් කිරීම් ගැන අපි සලකා බලන්නෙමු. යාත්‍රාවට ඇතුළු වීම ඕස්ට්‍රේලියාවට ආර්ථික ප්‍රතිලාභයක් ද ලබා දිය යුතුය. සේවා හෝ ආගන්තුක සත්කාර වැනි වෙනත් භූමිකා ඕස්ට්‍රේලියාවේ සේවකයින් විසින් පිරවිය යුතුය.

මේවා ඇතුළුව ඔබේ සංචාරක නිදහස් කිරීමේ ඉල්ලීම සමඟ ඔබ උපකාරක සාධක සැපයිය යුතුය:

- ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමට හේතුව සහ ආර්ථික වාසිය විදහා දැක්වීම තහවුරු කිරීම
- යාත්‍රාව වර්තමානයේ ඇති ස්ථානය
- ඔස්ට්‍රේලියාවට පැමිණීමට යෝජනා කරන ස්ථානය
- සංචාරක නිදහස් කිරීමේ ඉල්ලීමෙහි ඇතුළත් සියලුම කාර්ය මණ්ඩලය ස සේවකයින්ගේ රැකියා අරමුණ ඇතුළුව සම්පූර්ණ විස්තර
- අදාළ ප්‍රාන්ත හෝ භෞමික රජය විසින් නියම කරන ලද පරිදි නිරෝධායනය සිදු කරන බව තහවුරු කිරීම. එකඟ වූ විධිවිධාන පිළිබඳ උපදෙස් මෙයට ඇතුළත් විය යුතුය.
- අදාළ රාජ්‍ය හෝ දේශභූමි රාජ්‍යවල සහය

# සාමුද්‍රීය කර්මාන්තය

මුහුදුබඩ කාර්ය මණ්ඩලය (මගී යාත්‍රා නැව් සිටින කාර්ය මණ්ඩලය හැර) ගමන් සීමාවලින් නිදහස් වන අතර, ඕස්ට්‍රේලියානු දේශසීමා බලකා කොමසාරිස්වරයාගෙන් ලබාගත් පුද්ගලික නිදහස් කිරීමක් අවශ්‍ය නොවේ.

නිදහස් වන මුහුදුබඩ කාර්ය මණ්ඩලය අතරට පහත දේ ඇතුළත් ඇතුළත් වෙයි:

- ඕස්ට්‍රේලියානු ජල තීරයේ ඇති වාණිජ (මගී යාත්‍රා සහ සුපර්යොට් නැව් හැර) හෝ රජයේ නැව් ක්‍රියාත්මක වීමට හෝ සේවා සැපයීමට උපකාර කරන කාර්ය මණ්ඩල
- සාමුද්‍රීය නියමුවන්
- සාමුද්‍රීය මිනින්දෝරුවන්.

වාණිජ නැවක් යනු පහත ආකාරයට නිරතවී තිබෙන නැවකි:

- වාණිජ වෙළඳාම සහ භාණ්ඩ එහා මෙහා ගෙනයාම
- තොටුපල සහ නඩත්තු සේවා සැපයීම
- සම්පත් කර්මන්තය වැනි වැදගත් කර්මාන්තවලට උපකාර කිරීම
- සාමුද්‍රීය මැනීම.

ඔබ මෙම කාණ්ඩය යටතේ නිදහස් කිරීමක් ලබා ඇතිනම්, පහත දේ කල හැකිය:

- ඔබ හට අදාළ වීසා බලපත්‍රයක් ඇති නම්, ඕස්ට්‍රේලියාවට ඇතුළු වී පිටත්ව යාම
- ඔබ ඕස්ට්‍රේලියාවට ඇතුළු වූ ප්‍රාන්තයේ හෝ දේශභූමියේ නිරෝධායනය විය යුතුය. බොහෝ ප්‍රාන්ත සහ දේශභූමි නීතිවලට අනුව ඕස්ට්‍රේලියාවට ඇතුළු වන ජාත්‍යන්තර මුහුදුබඩ කාර්ය මණ්ඩලය (ගුවන් යානයකින්) විසින් **තමා මුලින්ම රටට ඇතුළුවන තොටුපලේ දින 14 ක අනිවාර්ය නිරෝධායනයකට යටත් විය යුතුය**.

බලන්න COVID-19 ජාත්‍යන්තර මුහුදුබඩ කාර්ය මණ්ඩලය සඳහා කොවිඩ්- 19 අවශ්‍යතා.